# මහජන සහභාගීත්වය හා එහි යථාර්ථය

*අයි. ආර්. පෙරේරා*
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

සහභාගීත්ව කළමනාකරණ *Participatory Management* සහභාගීත්වය ඇගයුම, *participatory Appraisal* සහභාගීත්ව නිරීක්ෂණය *participatory observation* ජනතා සහභාගීත්වය *people's participation* යන යෙදුම් වර්තමාන සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ ඉතාමත් සුලභ වචන බවට පත් වී තිබේ.දේශපාලනය සමාජ විද්‍යාව වැනිමෘදු විද්‍යා ක්ෂේත්‍රයක් හැරුණු විට අද වාරිමාර්ග කෘෂිකර්ම හා වෙනත් තාක්ෂණික විද්‍යා ක්ෂේත්‍රයන් තුළට ද "ජනතා සහභාගීත්වය" ඇතුල් වී ඇත. ජනතාවගේ සමාජ ආර්ථික ශුභසිද්ධිය සඳහා ක්‍රියාත්මක වන ඕනෑම සංවර්ධන වැඩසටහනකට එම වැඩසටහනේ ප්‍රතිලාභ ලබන ජන කොටස් යම් ආකාරයකින් සහභාගී කරවා ගත යුතු බව බොහෝ දෙනා විසින් පිළිගත් කරුණකි.

"ජනතා සහභාගීත්ත්වය" යන යෙදුමින් අදහස් වන්නේ කිසියම් සංවර්ධන වැඩසටහනක් තිසා සැලසුම්කරණය, තීරණ ගැනීම හා පවත්වාගෙන යාම ආදී අවස්ථාවන්ට, ප්‍රතිලාභ ලබන ජන කොටස් සහභාගී විය යුතු බවයි. මෙ නිසා "සහභාගීත්ත්වය" යන වචනය දුටු පමණින් කිසියම් ක්‍රියාදමයක් තුළ ජනතා සහභාගීත්වය ඇතුළත් වී තිබේ යැයි නිගමනය කිරීමට තරම් අප ඉක්මන් විය යුතු නැත. උදහරණයක් වශයෙන් සමාජ විද්‍යාවේ දී ප්‍රයෝජනයට ගැනෙන "සහභාගීත්ත්ව නිරීක්ෂණ" යන වචනයෙන් කිසිදු ආකාරයක ජනතා සහභාගීත්වයක් ලබා ගැනීම අදහස් නොකෙරේ. එහිදී සිදු වන්නේ සමාජ විද්‍යා පර්යේෂකයෙකු තම තොරතුරු එක් රැස් කිරීම සඳහා තමා ද පර්යේෂණ නියැදිය තුළට ඇතුළු වී තොරතුරු එක්රැස් කිරිමට කටයුතු කිරීමයි.

"ජනතා සහභාගිත්වය" යන යෙදුම නිශ්චිත අරුත් ඇති වචනයක් වශයෙන් ප්‍රයෝජනයට නොගන්නා බවත් විවිධ අවස්ථාවල විවිධ අරුත් දෙන දියාරු වචනයක් බවත් සැලකිල්ලට ගත යුතු ය. මේ නිසා කිසියම් කාර්යයක් සම්බන්ධයෙන් ජනතා සහභාගීත්වය ලබා ගැනීම යනුවෙන් යමෙක් අදහස් කරන්නේ කුමක් ද යන්න ඔහුගෙන් ම අසා දැන ගන්නවා විනා බාහිර අයෙකුට ඒ පිළිබඳව අර්ථ දැක්වීම තරමක් අපහසු කාර්යයකි. "සහභාගීත්වය" යන්න කොතරම් දියාරු ලෙස ප්‍රයෝජනයට ගැනෙනවා ද යන්න පහත සඳහන් අර්ථ දැක්වීම් වලින් පැහැදිලි වේ. කිසියම් දෙන ලද සංදර්භනයකට අනුව පහත සඳහන් ඕනෑම අර්ථයක් ප්‍රකාශ කිරීමට "සහභාගීත්වය" යන වචනයට හැකියාවක් තිබේ. පැමිණීම. රැස්වීමක දි නම් අසුන් ගෙන සිටීම, නම් ලකුණු කිරීමෙන් ඇතුළත්වීම, ඡන්දය දීම, අදහස් ප්‍රකාශ කිරීම හා ඒම අදහස් පිළිගැනීමට ලක්වීම,අදහස් ප්‍රකාශ වූ නමුත් එම අදහස් කිසිවකු විසින් නොපිළිගැනීම, තීරණ ගැනීම, තීරණ ක්‍රියාත්මක කිරීම, යම් කාර්යයක ඵල ප්‍රයෝජන ලැබීම ආදී ඕනෑම අර්ථයක් ප්‍රකාශ කිරීමට "සහභාගීත්ත්වය" යන වචනය යොද ගැනෙන බව අප අත්දැක ඇත. මේ නිසා යම් කාර්යයක් සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම යනුවෙන් අප අදහස් කරන්නේ කුමක් ද යන්න නිශ්චිතව දැන ගැනීම මත පමණක් ජනතා සහභාගීත්වය තක්සේරු කළ හැකිබව සිහි තබා ගැනීම වැදගත් ය.

සහභාගීත්ත්වය අඛන්ඩතාවයකින් යුතු ඒකීයත්වයකි *(continuem)* වෙන වදන වලින් කිවහොත් යම්සංවර්ධන වැඩසටහනකඉලක්ක ගතප්‍රතිලාභීන්විවිධ අනුපාත වලින් එම වැඩසටහනට සහභාගී වීම දැකිය හැකි ය. අවම වශයෙන් සහභාගී වීම යනු අදල සංවර්ධන වැඩසටහනේ ප්‍රතිඵල භුක්ති විඳීම් සඳහා වත් ජනතාව සහභාගී වීමයි. යම් සංවර්ධන වැඩසටහනක් විසින් ඉලක්ක කර ගනු ලැබූ ප්‍රතිලාභීහු එම වැඩසටහනේ ප්‍රතිඵල භුක්ති විඳින්නේ නැත්නම් ඔව්හු කිසිදු ආකාරයකින් එම වැඩසටහනට සහභාගී නො වෙති. එම සංවර්ධන වැඩසටහන නඩත්තුකර ගෙන යාම් වශයෙන් තීරණ ගැනීම් හෝ වෙනත් ආකාරයකින් ඊට සහභාගී වීම යනු සහභාගීත්ත්වය පිළිබඳ අඛණ්ඩ වූ ඒකීයත්වයේ ඉහළ අනුපාතයන් කරා ප්‍රතිලාභීහු ළඟාවීමකි. මේ අනුව, අප තීරණය කළ යුත්තේ "සහභාගීත්වය" යන්න ඒ ඒ ප්‍රතිලාභියා විසින් විවිධ ප්‍රමාණ වලින් දයක වීමේ හෝ හවුල් වීමේ මට්ටමක් බව යි.

"සහභාගිත්වය" යනු අඛණ්ඩ වූ ඒකීයත්වයක් නිසා සහභාගීත්වයේ මට්ටම් ප්‍රකාශ කිරීම සඳහා ද සහභාගි වන ප්‍රමාණය හා ස්වභාවය පෙන්නුම් කිරීම සඳහා ද විශේෂිත පද භාවිතයට ගනු ලැබේ. මේ අනුව සෘජු සහභාගීත්වය, වක්‍ර සහභාගීත්වය, ක්‍රියාකාරී සහභාගීත්වය, පූර්ණ සහභාගීත්වය යන යෙදුම් ප්‍රයෝජනයට ගැනිමමගින් සහභාගීත්වයේ තීව්‍රතාව

අවධාරණය කරනු ලබයි. යම් සංවර්ධන වැඩසටහනක් සඳහාප්‍රතිලාභීන් පූර්ණ වශයෙන් සහභාගි වීම යනු එම සංවර්ධන වැඩසටහනේ පහත දැක්වෙන ප්‍රධාන වැදගත් අවස්ථා තුනක් සඳහා සහභාගි වීම වේ. මින් පළමුවැනි අවස්ථාව සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීම සඳහා හවුල් වීමයි. දෙවැනි අවස්ථාව නම් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා එහි මෙහෙයුම් හා නඩත්තු තීරණ ගැනීම සඳහා හවුල් වීම යි. තුන්වන අවස්ථාව නම් වැඩසටහන විසින් ඉලක්ක කරනු ලැබූ ප්‍රතිලාභීන් කණ්ඩායම අරමුණු කරන ලද ප්‍රතිලාභ භුක්ති විඳීමෙන් හවුල් වීම යි.

රටක් සංවර්ධනය කිරීමෙහිලා ප්‍රයෝජනයට ගැනෙන ප්‍රධාන සංවර්ධන උපාය මාර්ග දෙකකි. ඒවා නම් පෞද්ගලික ව්‍යවසායක ක්‍රමය හා පොදු ව්‍යවසායක ක්‍රමයයි. පෞද්ගලික ව්‍යවසාය ක්‍රමයේ දී ග්‍රාමීය සංවර්ධන, නාගරීක කරණය, සෞඛ්‍යය, අධ්‍යාපනය; තැපැල්, විදුලිය හා අනෙකුත් බොහෝ කටයුතු පුද්ගලික අයිතිය හා ලාභාපේක්‍ෂාව මත තීන්දු වන අතර ඒ නිසා ම අදාල අංශ වල නිෂ්පාදන කාර්‍යක්‍ෂතාව කෙරෙහි පුද්ගලයන් හෝ සමාගම් පෞද්ගලිකව උනන්දු වෙති. නිෂ්පාදන අකාර්යක්‍ෂමතාවක් ඇති වුවහොත් පාඩු ලබන බැවින් නිෂ්පාදන අංශය කාර්‍යක්‍ෂමය හා ලාභදායීව පවත්වා ගෙන යාම බොහෝ විට සිදු වෙයි. එසේ නැතහොත් එම නිෂ්පාදන අංශ වසා දැමීමට සිදු වේ. දියුණු ධනවාදී රටවල සංවර්ධනයේ ප්‍රධානතම දයකයන් වන්නේ පුද්ගලයන් හා සමාගම් ය. එමනිසා ජනතාවගේ තීන්දු මත නිෂ්පාදන අංශ පවත්වා ගෙන යාමට වඩා පුද්ගලයන්ගේ හා සමාගම්වල තීන්දු මත ද්‍රව්‍ය හෝ සේවා නිෂ්පාදන අංශ පවත්වාගෙන යාමට මුල් තැනක් දෙති. ජනතාව ඒවාට හවුල්කරුවන් වන්නේ ද්‍රව්‍ය හෝ සේවා නිෂ්පාදනයේ අතුරු අවයව වශයෙනි. මේ රටවල සමාජ ආර්ථික රටාව මෙන්ම ආයතන රටාව ද මුළුමණින්ම පාහේ පෞද්ගලික ව්‍යවසා සංවර්ධන සංකල්පයට අනුරූප වන පරිදි සකස් වී ඇති අතර ප්‍රජාවගේ එදිනෙද ජීවිතයේ අවශ්‍යතාවන් වන මගුල්, අවමගුල්, ලෙඩදුක්, විනෝද කටයුතු ආදී සියල්ල පෞද්ගලිකකරණයට හසු වී තිබේ. ඒ ඒ ප්‍රජා අවශ්‍යතාවන් සඳහා ම විශේෂ වූ පෞද්ගලික සේවාවන් හිමි වී තිබෙන නිසාත්, ඒවා අතිශයින් කාර්යක්‍ෂමව ක්‍රියාත්මක වන නිසාත් ප්‍රජාවෙහි ඒ ඒ සාමාජිකයාට තනිතනිව තීරණ ගැනීමට, අතිශයින් පෞද්ගලිකව හැසිරීමටත් හැකියාව තිබේ. ශ්‍රී ලංකාව වැනි තුන්වැනි ලෝකයේ රටවල ප්‍රජා අවශ්‍යතාවයන් ඉටු කිරීමට බිහි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, මරණාධාර සමිති, අන්‍යොන්‍යාධාර සමිති, ශුභසාධක සමිති ආදි ජනතා සහභාගීත්වය මත ක්‍රියාත්මකවන නොයෙකුත් ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරකම්වල නියැලුනු සංවිධාන මේ රටවල දක්නට නැත. ඒ වෙනුවට ප්‍රජා උවමනාවන් ඉටු කරන පෞද්ගලික කරණය වූ ආයතන හා එම ආයතන වලට අදළ "යන්ත්‍රණ" බිහි වී තිබේ. මේ නිසා මෙවැනි රටවල ජනතා සහභාගීත්ත්වයක් අපේක්‍ෂාකරන්නේ සංවර්ධනයේ ප්‍රාථමික අවශ්‍යතා වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පවත්වා ගැනීම හෝ තීරණ ගැනීම සඳහා නොවන වඩා පුළුල් වශයෙන් සළකා බැලිය යුතු, එමෙන්ම පෞද්ගලික කරණයට හසු නොවූ විෂයයන් වන නගරය පිරිසිදුව තබා ගැනීම. පරිසරය රැක ගැනීම, ලෙඩ රෝග පැතිරීම වැලැක්වීම ආදී සේවාවන් සම්බන්ධයෙනි. මේ අනුව ඉතා පැහැදිළිව පෙනී යනකරුණක් වන්නේ "ජනතාසහභාගීත්ත්වය" රටක ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන විකල්ප උපාය මාර්ගයක්වූ පොදු ව්‍යවසායේ හෝ රාජ්‍ය ව්‍යවසායේ උපාංගයක් වශයෙන් පවතිනවා මිස පෞද්ගලික ව්‍යවසායේ අන්තර්ගතයක් සේ පැවතීමට ඉඩකඩක් නැති බවයි.

තුන්වන ලෝකයේ බොහෝ රටවල සංවර්ධනයේ ප්‍රධාන කාරකයෙකු වෙන්නේ රාජ්‍ය ව්‍යවසාය හෝ පොදු ව්‍යවසාය යි. මේ අනුව විවිධ ග්‍රාමසංවර්ධන වැඩසටහන් මගින් ග්‍රාමීය ජනතාව ඉදිරියට ගෙන ඒමත් ඒ සඳහා අදළ ජන කොටස් වල සහභාගීත්වය ලබා ගැනීමටත් අත්‍යවශ්‍ය වෙයි. ජනතාවගේ සහභාගීත්වය ලබා නොගන්නා කල්හි එම වැඩසටහන් ජනතාවගෙන් පරිබාහිර වූ "ආගන්තුක" වැඩසටහන් ලෙස පවත්නා අතර රාජ්‍ය මැදිහත්වීම අඩපණ වූ වහාම සංවර්ධන කාර්ය පවත්වා ගෙන යාම මුළුමනින්ම අඩපණ වේ. මේ නිසා ජනතා සහභාගීත්ත්වය ලබා නොගත් වැඩසටහන් කල් පවත්නා (sustainable) ප්‍රජා සංවර්ධන වැඩසටහන් ලෙස නො සැළකෙන අතර ප්‍රජාවගේ ඕනෑ එපාකම් මත ක්‍රියාත්මක වන ඒවා ලෙස ද නොසැළකේ. එබැවින් පොදු ව්‍යවසාය හා ජනතා සහභාගීත්ත්වය එකිනෙකින් වෙන් කළ නොහැකි වූ සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් තුන්වැනි ලෝකයේ සමාජ- ආර්ථික රටාව තුළ කිඳ බැස පවතී.

"සහභාගීත්ත්වය" යනු මිනිසාගේ චර්යා රටාවකි. සහභාගී වීම හෝ නොවීම හෝ අපේක්ෂිත කාර්ය කඩාකප්පල් කර දැමීම සඳහා කටයුතු කිරීම යන ඕනෑම ආකාරයකට මනුෂ්‍යයෙකුට තම චර්යාව එළිදැක්විය හැකි ය. කිසියම් පොදු සංවර්ධන කාර්යයක් සිදු වීම වැළැක්වීම සඳහා කටයුතු කරන පුද්ගලයන් ද ඇතැම් විට අපට හසු වේ.ඒ ද එක්තරා චර්යා රටාවකි. මෙ වැනි විවිධ චර්යා රටාවන් එළි දැක්වීම සඳහා පුද්ගලයන් පෙළඹෙන්නේ අහේතුක ව නොවේ. මනුෂ්‍යයාගේ ඕනෑම හැසිරීම් රටාවකට හේතු භූත වූ යම් යම් සාධක තිබේ. යමෙකුගේ චර්යා රටාව (හැසිරීම) තීන්දු කරනු ලබන නිශ්චිත වූ සාධක හඳුනා ගැනීමට හැකි නම් එම සාධක වෙනස් කිරීම මගින් ඔහුගේ චර්යාරටාව ද වෙනස් කළ හැකි ය. මේ නිසා "ජනතා සහභාගිත්ත්වය" අපේක්ෂා කරන ජනතාවගේ හැසිරීම තීන්දු කරන්නේ කුමන සාධක මත ද යන්න සොයා බැලීමට විශේෂයෙන් උනන්දු වියයුතු ය.

මනුෂ්‍යයාගේ සාමාන්‍ය හැසිරීම දෙස බලන කළ පැහැදිළිව පෙනෙන දෙය නම් යමෙකු වැඩියෙන්ම උනන්දුව දක්වන්නේ තමා සම්බන්ධයෙන් බව යි. අනතුරුව පවුලේ අය, නෑදෑයන් හෝ මිතුරන්, ගම් වැසියන්, රට වැසියන් වශයෙන් උනන්දුවේ තීව්‍රතාව හීන වෙමින් යයි. මේ නිසා සෘජුවම තමාට ප්‍රයෝජනයක් ලැබෙන පෞද්ගලික කරුණක් සම්බන්ධයෙන් යමෙකුගේ සහභාගීත්ත්වය පිළිබඳව කිසිදු ප්‍රශ්නයන් පැන නොනගී. තම දරුවන්, නෑදෑයින්, ආදී හු එල ලබන කාර්යයන් සම්බන්ධයෙන් ඔහුගේ උනන්දුව බෙහෙවින් ඉහළ මට්ටමක පවත්නා අතර ඉන් පිටස්තර වන විට එනම් තමාට හෝ තමාගේ පවුලේ අයට එම කාර්ය තීරණාත්මකව බල නොපාන විට උනන්දුව හෝ සහභාගීත්ත්වය හීන වී යයි. මේ හැසිරීම් රටාව සත්‍ය යයි අප පිළිගනු ලබන්නේ නම් අප එක්තරා නිගමනයකට එළඹීමට හැකි වේ. එනම්, ජනතා සහභාගීත්ත්වය ලබා ගැනීම ප්‍රශ්ණයක් වී ඇතැයි සාකච්ඡා කරන බොහෝ ග්‍රාම සංවර්ධන වැඩසටහන් වලින් ඒ ඒ පුද්ගලයාට පෞද්ගලිකව ලැබෙන ප්‍රතිලාභ බෙහෙවින් සීමිතවී ඇති බව යි. පුද්ගලයාට වාසියක් ලැබෙන ඕනෑම කාර්යයකට මැදිහත්වීම සාමාන්‍ය චර්යාව නම් වැඩි ප්‍රතිලාභ ලැබෙන වැඩසටහන් වලට වැඩි සහභාගීත්ත්වයක් ලබා ගැනීම ද ප්‍රශ්ණයක් නො විය හැකි ය.

බොහෝ ග්‍රාම සංවර්ධන වැඩසටහන් වලින් ඒ ඒ පුද්ගලයන්ට පෞද්ගලිකව අත් විය හැකි වාසිය තක්සේරු කළ නොහැකි නමුත් පොදුවේ ගමට, ප්‍රදේශයට හෝ සමාජයට ප්‍රතිලාභයක් ලැබෙන බැවින් ජනතාව සහභාගී විය යුතු යයි ඇතැම් අය කරුණු ඉදිරිපත් කරති. එහෙත් තර්කානුකූලව කරුණු සොයා බැලූ අයෙකුට පැහැදිළිව පෙනී යන්නේ සමාජය යනු පුද්ගලයන්ගේ එකතුවක් බැවින් ඒ ඒ පුද්ගලයාට ලැබෙන ප්‍රතිලාභ වල එකතුවෙන් සමාජ ප්‍රතිලාභය නිර්මාණය වන බවයි. මේ නිසා පුද්ගලයාට ලැබෙන ප්‍රතිලාභ අඩු යයි පිළිගන්නා විට සමාජ ප්‍රතිලාභයේ වටිනාකම ද අඩු විට හැකි බව අවධානය යොමු විය යුතු වැදගත් කරුණකි.

ග්‍රාම සංවර්ධන වැඩසටහන් වල දී බහුල වශයෙන් දැකිය හැකි, මාර්ග සංවර්ධන වැඩසටහන් උදහරණයක් ලෙස ගෙන සමාජ ප්‍රතිලාභ කෙරෙහි ජනතා සහභාගීත්වය බලපෑ හැකි ආකාරය විමසා බලමු. වන්නිකරයේ දිළිඳු දුරස්ථ ගම්මානයකට මාර්ගයක් සකස් කර දීම සඳහා යම් ග්‍රාම සංවර්ධන වැඩසටහනක් මගින් කටයුතු කරන්නේ යි ද ඒ සඳහා අදාළ ගම්වාසීන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ යයි ද අපි සිතමු. මෙහි දී ජනතා සහභාගිත්ත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරියාගේ ප්‍රධානතම සටන් පාඨය වන්නේ ගමට මාර්ගයක් සකස් කිරීම සියළු දෙනාට ම එක සේ වැදගත් වන බවත්, සියළු දෙනාට ම එක සමානව ප්‍රයෝජනවත් වන බවත් එබැවින් මාර්ගය සකස් කර ගැනීම ගම්වාසීන් විසින් ම කළ යුතු වන බවත් ය. බැලූ බැල්මට සංවර්ධන නිලධාරියාගේ කීම බෙහෙවින් සත්‍යයට බර ය, තර්කානුකුල ය.මේ නිසා ප්‍රථම රැස්වීමට පැමිණි ගම්වාසීන් සියළු දෙනාම මෙන් මේ අදහස අනුමත කරනවා ද ඇත. ඊට විරුද්ධ වන කිසිවකු ද සොයා ගත නොහැකි වනු ඇත. කෙසේ වුව ද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන විට සංවර්ධන නිලධාරියා අපේක්ෂාකළ ජනතා සහභාගීත්ත්වය ක්‍රමයෙන් හීන වී ගොස් ඇතැම්විට ක්‍රියාත්මක කළ නොහැකි තරමට සහභාගීත්ත්වය අඩුවීමට ද ඉඩ තිබේ. මෙම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ගම් වැසියන් සංඛ්‍යාව 100 ක් යයි හා එම ගම් වැසියන් පහත ආකාර සංයුතියකින් යුතු යිද සිතමු.

| | |
|---|---|
| හේන් ගොවීන් | 74 |
| වී වගා කරුවන් | 20 |
| ගුරුවරු | 01 |
| කුඩා පරිමාන වෙළඳුන් | 02 |
| ට්‍රැක්ටර් හිමියන් | 01 |
| අනියම් කුලීකරුවන් | 02 |
| එකතුව | 100 |

අදළ ගම්මානයට මාර්ගයක් සකස් කිරීම නිසා සියළු දෙනාටම එකසේ ප්‍රතිලාභ ලැබේ යයි සංවර්ධන නිලධාරියා ප්‍රකාශ කළ නිසාවත් ගම්වැසියන් සියළු දෙනා ම එය එසේ පිළිගත් නිසාවත් මාර්ග සංවර්ධන වැඩසටහනේ ජනතා සහභාගීත්වය තහවුරු නොවේ. මුලින් ද පෙන්වා දුන් පරිදි "සහභාගීත්ත්වය" යනු මානව චර්යා රටාවක් වන බැවින් ඉහත සඳහන් ගම්මානයේ ගැමියන්ගේ චර්යා රටා තීන්දු කරන සාධක අනුව ඔවුනුගේ සහභාගීත්ත්වය ද තීන්දු වනු ඇත. මෙම ගම්මානයට මාර්ගයක් සකස් කිරීමේ අවශ්‍යතාව දැඩි සේ දැනෙන අයගෙන් එක් අයෙකු විය හැක්කේ ට්‍රැක්ටර් හිමියායි. අනතුරුව පිළිවෙලින් වෙළඳුන්, ගුරුවරයා හා වී වගා ගොවීහු ආදී වශයෙන් අනෙකුත් ගැමියන් තුළ ද යම් යම් අවශ්‍යතාවයන් තිබිය හැකි ය. එහෙත් අනියම් කුලී කම්කරුවන් හා දවස පුරා හේනේ ගත කරන හේන් ගොවීන්ට මාර්ග සංවර්ධනයේ ප්‍රතිලාභ අවම වශයෙන් ලැබිය හැකිනිසා ඔවුන්ගේ සහභාගීත්ත්වය බෙහෙවින් අඩු වීමට ඉඩ තිබේ. ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා ලැයිස්තුවේ මාර්ග සංවර්ධනයට හිමි වන්නේ වඩා පහළ ප්‍රමුඛතාවක් බව අප තේරුම් ගත යුතු ය. මේ අනුව ග්‍රාම සංවර්ධන වැඩ සටහනක සමාජ - ප්‍රතිලාභ සියළු දෙනාටම එක සේ බෙදී යනු ඇතැයි යන උපකල්පනය තාත්ත්වික උපකල්පනයක් නො වේ. මේ නිසා ම සමාජ ප්‍රතිලාභ උදෙසා බහුතර ජනතාව ස්වේච්ඡාවෙන් සහභාගී විය යුතු යන පාඨයද නිශ්ප්‍රභා වනු ඇත.

ජනතාවගේ චර්යාව තීන්දු කිරීමෙහිලා සමජ වටිනාකම්, ආකල්ප හා සාරධර්මයන් ද හේතු වන බව ඔප්පු වී ඇති කරුණකි. විශේෂයෙන් ආසියාතික පැරණි සමාජ සාරධර්ම අනුව යමෙකුට පෞද්ගලිකව ප්‍රතිලාභයක් නො ලැබුණු පමණින් ම යම් කාර්යයකින් ඔහු මුළුමනින්ම වැළකී සිටීම සමාජ ක්‍රමය අනුමත නො කරනු ලැබුවකි. අනෙක් අතට කිසියම් කාර්යයක ප්‍රතිලාභ සමානුපාතික ව ජනතාව අතර හුවමාරු කර ගත හැකි සමාජ- ආර්ථික රටාවක් ද ආසියාතු සමජය තුළ මුල් බැසගෙන තිබුණි. මේ නිසා "කයිය" "අත්තම" අවමගුල් සිරිත් විරිත්, බලි - තොවිල් ලෙඩ දුක් ආදී විවිධ ආර්ථික හා ආර්ථික නොවන සමාජ උවමනා වල දී,පොදු ජනතාවගේ සහභාගීත්ත්වය කිසිදු භේදයකින් හා ගැටළුවකින් තොරව ස්වේච්ඡාවෙන් ම ලැබුණි. එබැවින් "සහභාගීත්ත්වය" ආසියාතික රටවල සමාජ -ආර්ථික පැවැත්මේ මූලිකාංගයක් බවට පත් ව තිබූ බවද පෙනේ. එහෙත් හරිත විප්ලවයේ රැල්ලටත්, කාර්මික විප්ලවයේ උනුසුමටත් හසු වී නවිකරණය වූ, මුදල් මත තීරණය වන නිදහස් ව්‍යවසාය සහිත ධනවාදී ආර්ථිකයක දී "කයිය" "අත්තම" වැනි සහභාගීත්ත්ව යාන්ත්‍රණ මෙන්ම "සහභාගීත්ත්ව සංකල්පය" යල් පීනූ සමාජ වටිනාකම් බවට පත් වී ඇති බව තේරුම් ගැනීම අවශ්‍ය ය.

ජනතා සහභාගීත්ත්වය පොදු ව්‍යවසායේ මූලිකාංගයක් වන බව මීට පෙර සඳහන් කළෙමු. පෞද්ගලික තීරණ මත ක්‍රියාත්මක වන නිදහස් ව්‍යවසායේදී ජනතා සහභාගීත්ත්වයට ප්‍රමුඛත්වයක් නො ලැබේ. මෙවැනි ආර්ථිකයන් තුළ ජනතා සහභාගීත්ත්වය අවශ්‍ය වන්නේ පෞද්ගලික කරණයට හසු නොවන ජාතික ගැටළු සඳහා බව ද සඳහන් කළෙමු. ශ්‍රී ලංකාව වැනි රටවල අද පවතින නිදහස් ව්‍යවසාය සංවර්ධන ප්‍රතිපත්ති සමග ජනතා සහභාගීත්ත්ව යාන්ත්‍රණ හා උපක්‍රම "යා දෙක නොරත රත" මෙන් නොපෑහෙන බව පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් වලින් ඉතා පැහැදිළි ව පෙනේ. නිදහස් ව්‍යවසායේ සීඝ්‍ර වර්ධනයකුත් පොදු ව්‍යවසායේ පසු බැස්මකුත් දක්නට ඇති ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පොදු ව්‍යවසායේ උපාංගයක් වූ ජනතා සහභාගීත්ත්වය වර්ධනය වී ඇතැයි තර්ක කළ හැක්කේ කවරෙකුට ද?

"ජනතා සහභාගීත්ත්වය ලබා ගැනීම සඳහා සමාජය සජීවීකරණය කළ යුතු ය." *(Social mobilization)* මේ වර්තමාන සංවර්ධන සටන් පාඨ වලින් ප්‍රධාන එකකි. එහෙත් පැහැදිළි සත්‍ය නම් ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්ත්වය ලබා ගනිමින් ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ තිබුනේ නම් ඒ අතැගිලි වලින් ගිණිය හැකි ප්‍රමාණයක් බව යි. බොහෝ ජනතා සහභාගීත්ත්ව ව්‍යාපෘති, හුදෙක්, වැඩසටහන් වාර්තා වලට, ව්‍යාපෘති වාර්තාවලට, ඇගයුම් වාර්තා වලට හෝ වෙන් කරන ලද මුදල් අඩංගු ලිපි ලේඛණ වලට පමණක් සීමාවී තිබේ. ජනතා සහභාගීත්ත්ව වැඩ සටහනක් තුළින් පිටතට ඇසෙන ශබ්දය ඇතුළතට ගිය විට දක්නට නැත. බොහෝ විට ඉලක්ක කර ගත් ජනතාවට ලැබුණු සැළකිය යුතු ප්‍රතිලාභයක් ද නැත. මෙම වැඩසටහන් යටතේ යාන වාහන, ගොඩනැගිලි, නිලධාරී වැටුප්, විදේශ පුහුණුවීම් හා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරණ පිරිවැයෙන් සුළු ප්‍රමාණයක් වත් සහභාගීත්ත්වය බලාපොරොත්තු වන ජනතාවගේ ආර්ථික ශුභසිද්ධිය සඳහා සෘජුවම යොදනවා නම් ජනතාවගෙන් මීට වඩා වැඩි සහභාගීත්ත්වයක් ලැබෙනු නො අනුමාන ය. එහෙත් විදේශීය අයතන වලින් මුදල් ආධාර ලබා දීමටත්, රාජ්‍ය නොවන සංවිධාන වල පැවැත්ම තීරණය කිරීමටත් මෙවැනි ව්‍යාපෘති අත්‍යවශ්‍ය වන නිසා ඉදිරියේ දීත් මහජන සහභාගීත්ත්ව ව්‍යාපෘති නිරන්තරයෙන්ම ක්‍රියාත්මකවනු ඇත. සමාජ පර්යේෂකයනට දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ ඇමතීම සඳහා හොඳ මාතෘකාවක් ද පර්යේෂණ වාර්තා ලිවීමට විෂය ක්ෂේත්‍රයක් ද මතු කර දෙන මහජන සහභාගීත්ත්ව වැඩසටහන් වලින් බොහෝමයක් හුදෙක් "වැඩසටහන්" මිස "ජනතාවගේ වැඩසටහන්" නොවේ. ස්ව ශක්තිය, ස්වෝත්සාහය, ආත්මාභිමානය, සජීවීකරණය, විපර්යාකාරකත්වය, සමාජ සංචලනය ආදී ආවරණ ප්‍රකාශන වලින් වසා තබා ඇති මහජන සහභාගීත්ත්ව වැඩසටහන් තෘප්ත කරන්නේ මහජනතාවගේ අවශ්‍යතාවන් ද නැතහොත් වෙනත් කාගේ අවශ්‍යතාවන් ද යන්න ජනතාව විසින් ම ප්‍රශ්න කළ යුතු කාලය පැමිණ ඇත.